**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>කොළඹ සහ යාපනය අතර වඩා සුවපහසු සංචාරයක් සඳහා මහව සිට ඕමන්තේ දක්වා කි. මී. 130 ක පමණ දුරකින් යුතු දුම්රිය මාර්ගය ඉන්දියානු සහනදායි ණය යටතේ සංවර්ධනය කෙරේ : මෙම මාර්ගය සංවර්ධනය කෙරෙන්නේ වසර සියයකට පසු ප්‍රථම වරටයි.</u>**

ඉන්දියානු ණය ආධාර යටතේ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ඇමරිකානු ඩොලර් මිලියන 91.26 ක පමණ ඉන්දියානු සහනදායි ණය ආධාරයක් යටතේ සංවර්ධනය කිරීම සඳහා වන ගිවිසුමක් IRCON International Limited සහ ශ්‍රී ලංකා රජය අතර 2019 ජූලි 18 වන දින කොළඹදී අත්සන් තැබිණ. IRCON හි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ සුනිල් කුමාර් චෞද්රි මහතා සහ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් එල්. පී. ජයම්පති මහතා මෙම ගිවිසුම සඳහා අත්සන් තැබූ අතර ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමා , ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී එම් . ජේ. ඩී. ප්‍රනාන්දු මහතා , IRCON International Limited හි විධායක අධ්‍යක්ෂ එස් . එල්. ගුප්තා මහතා සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ්‍ය අංශයේ ප්‍රධානී සුජා කේ. මෙනන් මහත්මිය ද මෙම අවස්ථාවට එක්විය.

මහව සිට ඕමන්තේ දක්වා ඉන්දියානු සහනදායී ණය ආධාර යටතේ සංවර්ධනය කෙරෙන දුම්රිය මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය කි. මී. 130 ක් පමණ වේ. මෙය හරස් මාරු දුම්රිය ස්ථාන 12 ක්, දුම්රිය ස්ථාන 7 ක් සහ හරස් මාරු 78 කින් සමන්විත වේ . මෙම දුම්රිය මාර්ගය නවීකරණය කෙරෙන්නේ වසර සියයකට පසු ප්‍රථම වරට වේ . මෙම ව්‍යාපෘතිය දැනට පැයට කි. මී. 60 ක් වන මෙම දුම්රිය මාර්ගයේ වේගය පැයට කි. මී. 120 ක් දක්වා දෙගුණ කරනු ඇති අතර නඩත්තු පිරිවැයද අවම කරනු ඇත . එසේම

මෙම ව්‍යාපෘතිය දුම්රිය මගීන්ට වඩා සුව පහසුවක් ලබා දීමටද ශ්‍රී ලංකා දුම්රිය සේවය වැඩි දියුණු කිරීමටද උපකාරී වනු ඇත.

මේ වන විට ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.3 ක පමණ ණය ආධාර ඉන්දියාව විසින් ලබා දී ඇත. ප්‍රධාන දුම්රිය මාර්ග සංවර්ධනය කිරීම, දශක කිහිපයක ගැටුම් වලින් අනතුරුව උතුර හා දකුණ යා කරමින් උතුරු දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ආදිය සිදුකරන ලද්දේ ඉන්දියානු සහනදායී ණය ආධාර යටතේය. සුනාමියෙන් හානියට පත් දක්ෂිණ දුම්රිය මාර්ගයද ඉන්දියානු ණය ආධාර යටතේ ප්‍රතිසංස්කරණය කරන ලදී. ඉන්දියාව මේ වන විට ශ්‍රී ලංකා දුම්රිය ක්ෂේත්‍රය තුළ කි. මී. 300 ක පමණ දුම්රිය මාර්ග සංවර්ධනය කර ඇති අතර කි. මී. 330 ක පමණ දුර ප්‍රමාණයක් සඳහා නවීන සංඥා සහ විදුලි සංදේශ පද්ධතීන් ලබා දී ඇත.

2017 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඉන්දියාව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 318 ක නව ණය ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ණය ගිවිසුම යටතේ දුම්රිය මැදිරි 160 ක් ලබා ගැනීම, මහව සිට අනුරාධපුරය දක්වා සංඥා සහ විදුලි සංදේශ පද්ධතිය නවීකරණය කිරීම සහ රත්මලානේ දුම්රිය වැඩපළක් පිහිටුවීම ඇතුළු විවිධ ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පවතී . ඩීසල් බහු ඒකක 6 ක්, දුම්රිය 10 ක්, භාණ්ඩ ප්‍රවාහන දුම්රිය 20 ක්, ඉන්ධන ප්‍රවාහන දුම්රිය 30 ක්, මගී ප්‍රවාහන මැදිරි 160 ක් සහ බස්රථ 500 ක් ද ඉන්දියාවෙන් ලබා ගැනීමට නියමිතය. එසේම ඉන්දියාව ශ්‍රී ලංකා දුම්රිය සේවකයන්ගේ හැකියා හා කුසලතා වර්ධනය කිරීමටද සැලකිය යුතු ලෙස දායක වී ඇත.

මෙම ව්‍යාපෘතිය, සම්බන්ධීතාවය වැඩි දියුණු කරන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව සමඟ අත්වැල් බැඳ ගැනීමට ඉන්දියාව දරන ප්‍රයත්නයේ කොටසකි.

*****

කොළඹ
2019 ජූලි 18